


# පාපිෂ්ඨයකුගේ ආවජර්නා 5

UNKNOWNDJ

කොහොම හරි පාන්දර මට ඇහැරුනේ දිව ගිල්ලෙන්න වගේ දැනුනු වතුර තිබහක් නිසා. වෙරි ගතිය අඩුවෙලා දැනෙන වතුර තිබහ උත්සන්න වෙලා. කලුවරේම වටපිට බලනකොට දැකපු දෙයින් මගේ හිතට විශාල අනුකම්පාවක් දැනුන. මට ඇද දීල බිම metress එකක් උඩ සීතලේ ගුලිවෙලා ඉන්න අචින්තව දැක්කහම මට හිතට පුදුම දුකක් දැනුන. කළුවරේ උනත් ඒ මූනේ තිබ්බ හරි හුරුබුහුටි හැගීම අපහු මට මගේ අතීතයට අරන් ගියා. සුදුනෝනත් ඔයවගේ නිදන් ඉන්න ෆොටෝ එකක් මාගාව තිබ්බ. එදා ඒ මූනේ තිබ්බ හරි සුන්දර පෙනුම මේ කෙල්ලගේ මූනෙත් තියනවා කියලයි මට හිතුනේ. එත් එක්කම සීතලට ගුලිවෙලා පූස් පැටියෙක් වගේ නිදන් ඉන්න හැටි. ඊට පොඩ්ඩක් එහායින් නිදන් ඉන්නේ නිල්මිණි. මම හිටන්නේ මම නිදාගෙන තියෙන්නේ මේ කෙල්ලෝ දෙන්නගේ ඇද. මම කරපු වැඩේ හරි නෑ වගේ හැගීමක් මට ඇති උනා. සීතලට ගුලිවෙලා නිදන් ඉන්න අචින්තගේ උරහිසින් අල්ලලා මම හෙලෙව්වා

“අචින්ත.. නංගි නැගිටින්න....” එහෙම කියන ගමන් මම උරහිස්ස හෙලෙව්වා.

“තව ටිකකින් නැගිටිමු අක්කේ...” කිව්ව කෙල්ල අස්දෙකවත් අරින්නේ නැතුව තවතවත් බ්ලන්කෙට් ඒක ඇතුලේ ගුලි උනා. මගේ මූනට නිකන්ම හිනාවක් ඇදුනා

“අචින්ත මම සුපුන් නැගිටින්න ළමයෝ නැගිටලා ඇදෙන් නිදාගන්න .......” මම අයිත උරහිසින් අල්ලලා හොලවන ගමන් කිව්වා.

එහෙම කිව්වහම එකපාරටම බයවෙලා වගේ ඇස්දෙක ඇරපු කෙල්ල මගේ දිහා බලන් හිටියේ යකෙක් දැකල වගේ. බැරි වෙලාවත් කෙල්ල කෑගහුවොත් ගෙදර ඉන්න අනිත් අය වැරදි දෙයක් හිතයි කියල මගේ ඔලුවට එකපාරටම අවා. එහෙම දෙයක් වෙන්න කලින් කතාකරන්න ඕන කියන ඒක මගේ ඔලුවට ෂණිකව අවා.

“නංගි මම සුපුන් අයිය. ඇයි බිම නිදාගෙන. ඇදෙන් නිදාගන්න..” කියල අපහු කිව්වා.

එතකොට තමයි කෙල්ල පියවි සිහියට ආවේ

“අම්මෝ අයියේ මම බය උන තරමක්...” ඔයා මාව හොදටම බය කළා... මොනාද අනේ නැගිටලා කරන්නේ තාම රෑ නේද.

“ඔව් ඔව් ළමයෝ තාම රෑ තමයි. ඔය ඇයි මේ බිම නිදාගෙන. මම වතුර ටිකක් බොන්න යනකොට ඔයාව දැක්කේ ....”

“අහ්හ් ඒක මිසක්. නෑ අය්යේ ඔය ඇදේ නිදාගත්ත නිසා අක්කයි මමයි බිම නිදාගත්තා. වෙන බෙඩ් එකක් නෑ මෙහේ එකයි.”

“පිස්සුද ළමයෝ බිම නිදාගන්නේ මේ සීතලේ ... අක්කටත් කථාකරන් ගිහින් ඇදෙන් නිදාගන්න... මට ඇහැරවන්න එපැයි... ”

“ඔයා නිදන්හිටපු නිසා පවු කියල හිතුනා. ඉතින් කතාකලේ නෑ...” “

කෙල්ල කියන්නේ නටන අස්දෙකකින්. ඒ ඇස්දෙක කළුවරේ උනත් දිලිසෙන හැටි මට පෙනුන. මට ඒ ඇස්දෙක මතක් කරන්නේ සුදුනොනගේ ඇස්දෙකමයි.

"කමක් නෑ අයියා ඔයා ඔකේ නිදාගන්නකො.... මට මෙහෙම හොදයි.... සීතල නෑ... "කෙල්ල කිව්වේ බොරුවට බව මම හොදට දන්නවා.

"හරි ඔයාට සීතල නැත්නම් අරයට සීතලයි නේ...." කියල මම ටිකක් එහායින් නිදන් ඉන්න නිල්මිණිව පෙන්නුවා.

"එයා දැන් නිදිනේ ඔහොම හිටපුදෙන් ඔයා ඕකෙන් නිදාගන්නකො...." කෙල්ල අපහු කිව්වේ රහසින් වගේ, මේ කෙල්ලගේ මුරණ්ඩු කම සුදුනොනගේ වගේමයි. හිටපු ගමන් ඒකට මට කේන්ති ගිය වෙලාවලුත් තිබුන.

"ඔයාල මේ බෙඩ් එකට එනවද මම නැත්නම් ගෙදර ගිහින් නිදා ගන්නද...." මම එහෙම කිව්වේ ඇදෙන් නැගිටින ගමන්.... එකපාරටම කෙල්ල මගේ අතින් අල්ලගත්ත...

"පිස්සුද අයියේ ඔයාට මේ රෑ යන්න. අනික අපි ඕකට අවහම ඔය නිදාගන්නේ කොහෙද...". කෙල්ල කතා කරන්නේ උගුරෙන්. දැන් තමයි මට යක්ෂය අවේස වෙන වෙලාව.

"මම දැන් ඒක පාරකුත් කිව්වා බෙඩ් එකට එනවද මම නැත්නම් ගෙදර ගිහින් නිදා ගන්නද ?" අතත් ඇදල ගන්න ගමන් මම කිව්වේ.

කෙල්ල ඒ පාරනම් පොඩ්ඩක් බය උනා වගේ.

"අනේ අය්යේ දැන් යන්න එපා. හරි ඉන්න මම අකක්ට කථාකරන්නම්". කියල නිල්මිණිට ඇහැරෙව්වා... ඒ අතරේ මම වතුර ටිකක් බීල එන්නම් කියල kitchen ඒක පැත්තට ඇවිදන් ගියා. වතුර ටිකක් බීල එනකොට නිල්මිණි ඇදට ගිහිල්ල හිටියත් අචින්ත එතන හිටගෙන ඉන්නවා.

ඔයත් නිදාගන්න නංගි ඕකෙන්. මම ඉස්සරහ sofa එකේ ඉන්නම් කියල ඉස්සරහට ගියා.... සෝෆා එකට ගිහින් ටිකක් ඇලවෙලා ඉන්නකොටම මටත් නොදැනීම නින්ද ගියා. පහුවදා උදේ පාන්දර මම ඇහැරෙනකොට අචින්තත් මට ඉස්සරහ මිනි සෝෆා එකේ නිදන් ඉන්නහැටි මම දැක්ක... මටම හිතාගන්න බෑ මේ කෙල්ල හැසිරෙන විදිහ.

උදේ කට්ටිය ඇහැරෙනකොට මම එළියේ තියන බංකුවට වෙලා නිමක් නොපෙනෙන මීදී යය දිහා බලන් ඉන්නවා

"Good Morning මචන්. කොහොමද හොදට නින්ද ගියාද?" පිටිපස්ස හැරිලා බලනකොට ඒ රුවන්.

"Gud Morning මචන්. ඔව් බන් දන්නෙම නැතුව නින්ද ගියා. පොඩ්ඩක් වැඩියෙන් ගත්තනේ . පාන්දර ඇහැරෙනකොට මම අචින්තගේද කොහෙද බෙඩ් එකේ. එයාල බිම..."

"අහ්හ්!! ඔව් බන් මම කිව්වේ උබව මගේ රූම් එකට ගෙනියන්න කියල. කෝල් එකේ හිටපු නිසා බලන්න බැරි උනා. බැලින්නම් මේකි උවබ ගෙනිහින් එයාගේ ඇදට දාල. පස්සේ උබට එහෙම්ම ඉන්න කිව්වා නිදි නිසා."

"එකනේ බන්. මම කිව්වේ වදයක් වෙනවා කියල. කොහොමද බන් සීතලේ බිම නිදාගන්නේ ? මම පස්සේ එයාලට ඇදට යන්න කියල සොෆ එකෙන් නිදා ගත්ත."

"කොහෙද අවී මුරන්ඩුයිනේ... මම කිව්වා මගේ බෙඩ් එකෙන් නිදා ගන්න මම බිම නිදාගන්නම් කියල. අහන්නේ නෑ .... දන්නවානේ කෙල්ලොන්ගේ හැටි මචන්... කිව්වොත් කිව්වා !..."

ඒත් එක්කම දුම්දාන කොපි කෝප්ප දෙකක් අරගෙන අපි ඉන්න දිහාවට ඇවිදගෙන එන අවින්තගේ රූපය මම දැක්ක. උදේම දකින්න හරි ලස්සන දශර්නයක් කියල මගේ හිත මටම කිව්වා.

"ආ Good Morning සුපුන් අය්යා...." තේ බොන්න. කියල ලස්සන හිනාවකුත් එක්ක මට කොපි mug එක දුන්න. එත් එක්කම රුවනුත් කොපි mug එක අරගෙන කෝල් එකක් ගන්න තියනවා කියල ගෙදර පැත්තට යනවා මම දැක්ක. ඒ ගියේ අවින්තට ඇහැකුත් ගහගෙන.

"ඔය තේ බිව්වද ?" මම අවින්තාගෙන් ඇහුවේ මම තනියම කොපි බොන ඒක හරි නෑ කියල මට හිතුන හින්දයි.

"පස්සේ බොන්නම් අය්යේ..." කියල කිව්වේ හරිම හුරතල් විදිහට...

"එහෙනම් ඔයා මේකෙන් ටිකක් බොන්න" කියල මම mug ඒක කෙල්ලගේ දිහාවට දික්කළා

"එපා අය්යේ ඔය බොන්නකෝ.. මම පස්සේ බොන්නම්. තිබහ නෑ..."

"තිබහට නෙමෙයිනේ බොන්නේ පුරුද්දටනේ. ආ මේකෙන් ටිකක් බොන්න" කියල mug ඒක ආපහු කෙල්ලගේ දිහාවට දික්කළා.

"ඔයා ටිකක් බීල දෙන්න එහෙනම්...." කෙල්ල කිව්වේ හරි අමුතු හැගීමකින්... මට ඒ වචනටිකයි සිදුවීමයි මගී ජීවිතේ ඈතට අරගෙන ගියා. ඉස්සර මමයි සුදු නෝනයි තේ බොනකොටත් එයා මට මුලින්ම බොන්න දීල පස්සේ මම දෙන ටික බොන්න පුරුදු වෙලා හිටියා. ඇත්තටම ඒ විදිහට කරේ ඇයි කියල මට එච්චර තේරුනේ නැතත් පස්සේ කාලෙකදී එයා මාගාව නැති කොට ඒ හැගීම මගේ පපුව කඩන යන දෙයක් බවට පත්වෙලා තිබ්බ. ඇත්තටම අපි ආදරේ කරපු විදිහ මට හිතාගන්න බෑ

මම ටිකක් බීල දුන්න mugඒක කෙල්ල අත්දෙකෙන් අල්ලගත්තේ මහමෙරක් වගේ....

"දැන් ඔයත් එනවද යන්න town ඒක පැත්තේ...." මම එහෙම ඇහුවේ ඇයි කියල මට හිතගනන්වත් බෑ. මගේ යටිහිත මේ කෙල්ලව දකින්න ආසවෙලවත්ද ?

"හ්ම්ම්...... මම එන්න ඕනද?..." කෙල්ල ඒක ඇහුවේ හරිම දගකාර කමකින්.

"කැමතිනම් යමු. හිටියත් කරනන් දෙයක් නෑ නේ. අනික නිවාඩු නිසා රවුමක් දාමු කට්ටිය පිටින්...."

"ඔය ඇත්තමද....?" කෙල්ලගේ මූනේ හිනාවක්.

"ඔව් බොරු කියල තෑගී ගන්නද?" මම කිව්වේ දිව දික්කරන ගමන්.

කෙල්ල ගේ පැත්තට දිව්වේ "මම කට්ටියට කියන්නම්" කියාගෙන.

මම රවුමක් දාමු කිව්වට කොහේ යන්නද කියල මට හිතාගන්න බෑ. මෙයාලගේ visa copy ගන්නත් උවමනා නිසා ටෝව්න් ඒක පැත්තට යන්න මම හිතුව. මොනවා උනත් වෙන ලංකාවේ අයට වඩා මේ කොල්ලෝ කෙල්ලෝ සෙට් ඒක මගේ හිතට ඇල්លුවේ ඇයි කියන්න මම දන්නේ නෑ. සාමාන්‍යෙන් මම ලංකාවේ අයට උදව් කරන්න අකමැති උනත් මේ කට්ටියට උදව්වක් කරපන් කියල මගේ යටි හිත ගොඩක් වද දුන්න. නමුත් මම මගේ රස්සාව පිළිබද ඇත්ත විස්තරේ මෙයාලට කියල නැති නිසා මගේ හිතේ කණගාටුවක් සහ පොඩි බයක් තිබ්බ මිත්‍රකමට ඒ හේතුව නිසා මොනාහරි වේවි කියල, එත් එක්කම මට මතෙකට ආවේ මගේ town එකේ ඉන්න super market එකේ manager කෙනෙක්. මිනිහව හම්බඋනානම් රස්සාවල් කීපයක් ඉල්ලා ගන්න පුළුවන් බව මට මතකෙට ආව.

Taxi දෙකක් ගෙන්න ගත්ත අපි මගේ town ඒක උන Enger Bruch පැත්තට ගියා.

Town එකෙන් බැහැල උදේට කාල අපි හැමෝම පොඩ්ඩක් ඇවිද්ද. මේ යන හැමවෙලාවෙම අචින්ත මගේ ලගින්ම ගියත් ඒක මට ඒහැටි නොදැනුනේ ඇයි කියන්න මම දන්නේ නෑ. හිටපුගමන් ඇගේ හැප්පි හැප්පි අපි ගියත් මට මේ කෙල්ලගන එහෙම විශේෂ හැගීමක් දැනුනේ නෑ. සමහර වෙලාවට ඒ නටන ඇස්දෙක මට කතාකරනවා වගේ කියල හිතුනත් මම මගේ හිත පාලනය කරගෙන හිටියේ.

“මචන් උබල කැමතිනම් පොඩ්ඩක් එහා තියනවා Super Market එකක්. පොඩ්ඩක් ඔලුව දාල බලමු ජොබක් සෙට් කරගන්න පුලුවන්ද කියල....”. මම කිව්වේ පොඩි බල්ලපොරෝත්තුවක් ඇතුව.

“අඩෙ එහෙමද බලමු බන් එහෙනම් මෙච්චර දුර ආපු එකේ....” රුවන් කිව්වේ විශාල බලාපොරොත්තුවක් ඇතුව බව මට තේරුණා. ඒක වෙලාවකට බයත් හිතෙනවා ජොබ් එකක් හොයල දෙන්න බැරුව මේ කට්ටිය upset යාවිද කියල. මට කරනන් පුළුවන් උපරිමය කරනවා කියන හැඟීමෙන් මම ඒ පැත්තට ඇවිදන් යන්න පටන් ගත්ත.

ඒ එක්කම දුවගෙන අපු අචින්ත මගේ අතින් අල්ලලා කතා කරා.

“අයියේ ඔයා වැඩ කරන තැනද? මටත් මොනාහරි තිබ්බොත් බලන්න හරිද... cleaning job එකක් උනත් කමක් නෑ..” කියල කිව්වේ අමුතුම හැගීමකින්.

මට ඒ වෙලාවේ හිතුන මම මුලින් බොරු කිව්වේ අපරාදේ කියල. මොකද මේ ජීවිතවල තියන බලාපොරොත්තු මගේ වගේ නෙමෙයි.. ගොඩක් උසස් සහ හීන ගොඩක් උඩ ජීවත්වෙන මේ කට්ටියගේ අනාගතේ ගැන විශාල බලපොරෝතුවක් තියන වග මට ඒ වචන ටිකෙන් තේරුණා දෙයක්.

“නෑ නංගි. මම දන්නා කෙනෙක් ඉනන්ව බලමු ට්‍රයි එකක් දාල. මගේ ජොබ් ඒක ගැන මම පස්සේ කියන්නම් කෝ .....” මම එහෙම කිව්වේ ඇත්තටම මේ කෙල්ලට ඇත්ත කියනන් ඕන කියන හැඟීමක් මට ඇති උන නිසා.

“අහ්හ්... එහෙමද.... මම හිතුවේ ඔය වැඩ කරන තැන කියල. එකයි එහෙම කිව්වේ...” කෙල්ල කිව්වේ බලාපොරොත්තු කඩවුන කටහඩකින්.

“ඇයි ඒ මම වැඩකරන්නේ නැත්නම් ඔයාලට ජොබ් ඒක එපාද ?”

“නෑ එහෙම නෙමෙයි... කමක් නෑ... ඔයත් හිටියනම් බයක් නෑනේ...”

“එහෙම අවුලක් වෙන්නේ නෑ ... අනික මම ඔය හිතන තරම් හොඳ නෑ....”

“අනේ යනවා යන්න මොඩය... ඔය එහෙම නෑ ...” කියල මා එක්ක හිනා උනේ  හරිම කෙළිලොල් විදිහට. ඒ හිනාව එක්ක කම්මුල් දෙකේ හැදෙන dimples මට මතක් උනේ සුදු නෝනගේ හිනාව. මම මගේ ජීවිතේ දැකපු ලස්සනම දකින්න අසකරපු හිනාව තමයි ඒක. මේ කෙල්ල නිසා ඇත්තටම මට මගේ ජීවිතේ ගොඩක් දේවල් අපහු මතක් වෙනවා නේද කියල මගේ ඔලුවට ආව.

“බලපන්කො මෙකිට දැන් මාව මතකත් නෑනේ .....” නිල්මිණි කිව්වෙ අචින්තට අනික් හැමෝම හිනහ ගස්සවමින්.

“ඔව් ඔව් මටත් දැන් පේනවා කෙල්ලට කට්ටියව මතකත් නෑ කියල”  මිල්ටන් කිව්වේ අචින්තව තවත් අවුස්සන්න බව මට තේරුණා. කට්ටිය දිහා රවල බලපු අචින්ත මගෙන් පොඩ්ඩක් එහාට උනේ කට්ටියගේ විහිළුවලින් බේරෙන්න බව මට තේරුණා

එහෙම්ම විහිළුවෙන් super market එකට ආපු මම කෙලින්ම ගියේ කට්ටියත් එක්ක manager room ඒක පැත්තට. මගේ වෙලාවේ හොඳකමටම ඒ වෙලාවේම දොරත් අරගෙන එලියට අවේ මගේ මිත්‍රය උන ජර්මන්ජ ජාතික Deiter

කියන වයස අවුරුදු 50 උන පුද්ගලයා. ගොඩක් මිත්‍ර ශීලී මනුස්සයෙක් වෙන Deiter හරියට කොල්ලෙක් වගේ විහිළුවෙන් ජීවත් වෙන ගොඩක් මිනිස්සුන්ට උදව් කරන්න කැමති ජාතියේ චරිතයක්.

“Hallo Bruder. Wie geht es dir ( හලෝ මිත්‍රය උබට කොහොමද?)”

Deiter මව පිළිගත්තේ සහෝදරයෙක් වගේ. එත් මේ මනුස්සය මගේ තාත්තගේ වයසේ කෙනෙක් බව දැක්ක අචින්ත ඇතුළු කට්ටිය බලාගෙන හිටියේ කට ඇරගෙන

“Hallo hallo vati Mir geht es gut und dir? ( හලෝ හලෝ තාත්තේ උබට කොහොමද ? මම හොදින්)”

“nicht schlecht. Aber beschäftigte Tage. Du weißt fucking xmas! also warum bist du hier ( වරදක් නෑ එත් උබ දන්නවනේ නත්තල් කියන්නේ එපා වෙනවා අපිට. ඉතින් මොකද හදිස්සියේ මේ පැත්තේ )”

“Ich brauche Hilfe von dir. Das sind meine fremden Freunde. Dort finden einige Teilzeitjobs. Wenn du ihnen die Chance geben könntest für mich. Weil im moment da fließt ( මට උබෙන් පොඩි උදව්වක් ඕන. මේ මගේ ලංකාවේ යාලුවෝ කට්ටියක්. මේ දවස්වල පොඩ්ඩක් අමාරුවෙන් දුවන්නේ. නැද්ද උබ ගාව හොද part time ජොබ් ටිකක්. ලොකු උදව්වක් මවන්)”

“Was zum Teufel Du kommst korrekte zeit Wir brauchen 4 speicherjungs, müssen aber heute abend arbeiten Brauche auch aktuelle visa kopie am morgen Du weißt, dass die Migration uns fickt. ( මොන හු.@#@ ද බන් උබ ආවේ නියම වෙලාවට. මටත් මේ රාක්කවල බඩු අහුරන කොල්ලෝ ටිකක් නැතුව ඉන්නේ. හැබැයි අද රෑ shift එකේ ඉදන් වැඩ කරන්න ඕන. උදේම visa copy ඕන. මොකෝ imigration එකෙන් අපිට හැම තිස්සෙම කෙලිනවනේ...මොකද කියන්නේ ?”

“Warte, ich werde fragen ( පොඩ්ඩක් හිටපන් මම අහන්න.)” ඒ අහපු දේ ඇත්තටම මට මාර සතුටක් හිතට දැනුන. මොකද කොල්ලෝ ටික වෙනුවෙන් දෙයක් කරන්න පුළුවන් උන කියන හැඟීමත් එක්ක මම රුවන් ඉන්න දිහාවට ඇවිදන් ගියා

“මොකෝ බන් කියන්නේ වැඩේ හරියන්නේ නැද්ද ?” රුවන් ඇහුවේ කට අරගෙන බලාපොරොත්තු කඩවුන හැඟීමකින්.

“පිස්සුද බන් මේ සුපුන් වැඩකට බැස්සොත් අවුල් නෑ. උබලගේ වෙලාව හොදයි. රාක්කවල බඩු අහුරන කොල්ලෝ 4 දෙනෙකුට vacancies තියනවා. හැබැයි අද night shift එකේ ඉදන් වැඩ කරන්න ඕන. Visa copy උදේ දෙන්න කිව්වා. එකනම් දැනුත් තියනවනේ...”

“අම්මටසිරි නියමයිනේ බන්.... අවුලක් නෑ දැන් ඉදන් උනත් කරමු” එහෙම කිව්වේ සුදත්.... ඒ හිත්වල තිබ්බ බලාපොරොත්තු කොච්චරද කියල ඒ වචන ටික කිව්ව විදිහෙන් මට හිතාගන්න පුළුවන් උනා.

“ඔව් බන් මේකනම් පට්ට වෙලාව. අවුලක් නෑ අපි කරන්නම්. උබ කියපන් ok කියල...” එහෙම කිව්වේ රුවන්.

“අය්යේ අපිට මුකුත් නැද්ද කරන්න..... ?” බලාපොරොත්තු කඩවුන මුහුණක් එක්ක කෙල්ල මගෙන් ඇහුවේ හරිම දුක හිතෙන විදිහට.

“දැනට නෑ නංගි.. බලමු ටව දවසක් දෙකකින් අපහු කතා කරලා.” මම කිව්වේ කෙල්ලගේ හිත සනසන්න උවමනාවෙන්

එත් එක්කම Deiter හිටපු පැත්තට ඇවිදන් ගිය මම රුවන්ල වැඩ කරන්න කැමති බව කිව්වා. හවස 6ට Deiterව හම්බවෙන්න කිව්වා ඔහු මගෙන් නික්මුනේ මාව බදාගෙන සුබ පතල. super market එකෙන් එලියට එනකොටත් කෙල්ලගේ මූණ එච්චර හොද නෑ...

“මොකෝ ආවී මූන එල්ලගෙන. බයවෙන්න එපා අපිටත් එකක් සෙට් වේවි...” එහෙම කිව්වේ නිල්මිණි..

එත් කෙල්ලගේ කිසි කතාවක් නෑ.. මූණ බිමට හරවාගෙන යනවා. මටත් වෙන කරන්න දෙයක් මේ වෙලාවේ නැති නිසාත් කෙල්ල බුම්මගෙන ඉන්න නිසාත් මමත් වැඩිය කතා කරන්න ගියේ නෑ..

“මවන් දැන් 12යි. හවස එන්නත් ඕන නේ. ඒ නිසා අපි ගියොත් හොදයි.” රුවන් කිව්වේ අලුත් ජොබ් එකට යන්න තියන උවමනාව නිසාමයි.

“දැන් හදිසියේ ගිහින් එන්න මහන්සි ඇති නේ.. අද මගේ ගෙදර ඉදල හෙට උදේ ගිහින් එන්න. අනික දැන් හවස ගියහම ශිෆ්ට් වැටේවි එතකොට මේ හරියෙන් ඉන්න තැනක් හොයා ගන්න වේවි...” මම කිව්වේ ඇත්තටම මේ කොල්ලොටිකට පොඩි කට්ටක් කන්න වෙන බව දැනුන නිසයි.

“අනික දැන් කවුද 4 දෙනා වැඩ කරන්නේ ඒක කොල්ලෙක් ඉතුරු වෙනවා. එයාට තමයි ගෑනු ළමයි ටික බලාගන්න වෙන්නේ...” මම කිව්වේ හිනා මුසු මුහුණෙන්.

“මිල්ටන් අයිය ඉදි මවන් එයාට පොඩ්ඩක් අසනීප නිසා අපි කට්ටිය යන්නම්. අනික නයන අක්කත් ඉන්නවනේ ....” කියල රුවන් කින්ඩි හිනාවක් දැම්මා.

“එත් බන් අපි අද උබේ ගෙදර හිටියොත් කරදරයි.” රුවන් කිව්වේ ඇත්තටම බව මට තේරුනා ....

ඇත්තටම මට office එකෙන් දීල තිබ්බ ගෙදර පවුලකට ඉන්න පුළුවන් සාමාන්‍ය විශාල ප්‍රමාණයේ එකක්. එකේ කාමර 3ක් එක්ක තිබුන නිසා මට මී කට්ටිය නැවතගන්න ඒක ගැන ලොකු ප්‍රශ්නයක් තිබුනේ නෑ..

“ඔව් අය්යේ අපි අවොත් කරදරයි.... ඒ නිසා අපි දැන් යන්නම්....” අචින්ත කිව්වේ හිතට අවන්කවම බව බිදුණු කටහඩ මට කිව්වා.

“එහෙම එකක් නෑ. අනික මෙයාල මෙහේ හිටියහම ඔයාලට එහෙ තනියම ඉන්නත් බෑ නේ. ඒ නිසා තැනක් හොයගන්නකම් මගේ ගෙදර ඉන්න නවතින්න ..... මිල්ටන් අය්යියට කියන්න කට්ටියට හරියන්න ඇදුම් ටිකක් අරන් එන්න කියල ගිහිල්ල එතකොට වැඩේ ඉවර නේ...”

“ඒ උනාට අයියේ ......” කියල අචින්ත කියනකොටම.

“ඔයාලට කැමති දෙයක් එහෙනම් කරන්න....” කියල මම පාර පැත්තට යන්න හැරුන.

“එත් එක්කම මාගවට ආව රුවන් මවන් උබට සිරාවටම අවුලක් නැද්ද? අපි තැනක් ඉක්මනට හොයාගන්නම්” කිව්වා...

“මෙහෙමයි මවන් තැනක් හොයා ගන්න කලින් වැඩට පලයන්කෝ.. ජොබ් ඒක කරනකොට ඒක එපාවෙන විදිහට කරන්න බෑනේ... උබල දවසට දෙපැත්තට train එකේ ගියහම එකත් මාසෙට ලොකු ගානක්. එකත් ඉතුරුවෙන වැඩක් මම කිව්වේ... උබල කැමති තීරණයක් ගනින්. දැන් යනවනම් වරෙන් මාත් එක්ක.” කියල ඉස්සරහට ඇවිදන් ගියා...

එත් එක්කම කට්ටියට කතාකරපු රුවන් මගෙත් එක්කම පාරට ඇවිල්ල taxi දෙකක් නවත්තගෙන මගේ ගේ පැත්තට යන්න පිටත් උනා....